# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1980 සැප්තැම්බර් මස 05 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ඔක්තෝබර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : ශත 90 යි    තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1980 සැප්තැම්බර් මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 13/79.

**පළිබෝධ නාශක සම්බන්ධයෙන් බලපත්‍ර දීම සඳහා ද ඒවා ආනයනය කිරීම, ඇසිරීම, ලේබල් කිරීම, ගබඩා කිරීම, සංයෝග සකස් කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හා පාවිච්චි කිරීම විධිමත් කිරීම සඳහා ද පළිබෝධ නාශක පිළිබඳ බලපත්‍ර අධිකාරිවරයකු පත් කිරීම සඳහා ද පළිබෝධ නාශක රීති කමිටුවක් පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මේ පනත,— **පනත අදාළ කිරීම.**

(අ) සක්‍රිය රස ද්‍රව්‍යවලට සහ අන්තර්ගත කරන ලද සහකාරක ද්‍රව්‍ය සහිත පළිබෝධ නාශක සංයෝගවලට ; සහ

(ආ) පළිබෝධ නාශක සංයෝගවල අන්තර්ගත කර ඇති සහකාරක ද්‍රව්‍යයක් නොවන යම් සහකාරක ද්‍රව්‍යයක්, පළිබෝධ නාශක සංයෝග ඉසින ටැංකිය හෝ ඒ සංයෝග අඩංගු වෙනත් යම් භාජනයක් හෝ පාවිච්චි කරන අවස්ථාවේ දී ඊට එකතු කිරීම සඳහා විකුණනු ලබන්නේ නම්, එවැනි සහකාරක ද්‍රව්‍යවලට

අදාළ වන්නේ ය.

3. (1) පළිබෝධ නාශක පිළිබඳ බලපත්‍ර අධිකාරිවරයා වන පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයකු පත් කරනු ලැබිය යුතු ය. **පළිබෝධ නාශක පිළිබඳ බලපත්‍ර අධිකාරිවරයා.**

(2) පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා විෂ විද්‍යාව සහ පළිබෝධ මර්දනය හා සම්බන්ධ ජීව විද්‍යාත්මක විෂයයන් පිළිබඳ දැනීමක් ඇති තැනැත්තකු විය යුතු අතර, ඔහු කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට වගකිව යුතු වන්නේ ය.

4. (1) මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන, පළිබෝධ නාශක රීති කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය. **පළිබෝධ නාශක රීති කමිටුව.**

(2) ඒ කමිටුව පහත දැක්වෙන පරිදි, එනම්—

(අ) නිල බලයෙන් සාමාජිකයන් වන—

(i) (මෙහි මින් මතු "අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලබන) තත් කාලයෙහි කෘෂිකර්ම අධ්‍යක්ෂ ධුරය දරන තැනැත්තාගෙන් ; සහ

(ii) (මෙහි මින් මතු "රෙජිස්ට්‍රාර්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන්, සහ

ඊ 49925—14,500 (80/06)

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු, පළිබෝධ නාශක පාවිච්චි කිරීම පිළිබඳව හෝ පළිබෝධ මර්දනය හා තදාශ්‍රිත විද්‍යාත්මක ශික්ෂණයන්හි පළපුරුද්දක් ලබා ඇති හෝ තැනැත්තන් අට දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින්

සමන්විත විය යුතු ය:

එසේ වුව ද පළිබෝධ නාශක නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, අලෙවි කිරීම, සකස් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හෝ විකිණීම සම්බන්ධයෙන් වාණිජමය සම්බන්ධතාවක් ඇති කිසිම තැනැත්තකු එසේ පත් කරනු නොලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා පැමිණ සිටී නම්, ඔහු විසින් කමිටුවේ සෑම රැස්වීමකම මූලසුන දරනු ලැබිය යුතු ය. ඒ යම් රැස්වීමකට අධ්‍යක්ෂවරයා පැමිණ නොසිටී නම්, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලසුන දැරීමට තෝරා පත් කර ගත යුතු ය.

(4) නිල බලයෙන් පත් වන සාමාජිකයන් හැර අන්‍ය සෑම සාමාජිකයකු ම මරණය, ඉල්ලා අස්වීම හෝ අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කළහොත් මිස, ඒ ධුරයට පත් කරන ලද දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සිය ධුරය දැරිය යුතු ය:

එසේ වුව ද, මිය ගිය, ඉල්ලා අස් වූ නැතහොත් අන්‍යාකාරයකින් ධුරය හිස් කළ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන යම් සාමාජිකයකු තමා ද කලින් ධුරය හිස් නොකරන්නේ නම්, තමා යම් සාමාජිකයකුගේ අනුප්‍රාප්තිකයා වන්නේ ද ඒ සාමාජිකයාගේ ඉකුත් නොවී ඇති ධුර කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(5) නිල බලයෙන් පත්වන සාමාජිකයන් හැර, කවර වූ හෝ සාමාජිකයකු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් කිසිදු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර ඒ ඉවත් කිරීම පිළිබඳව කිසිදු අධිකරණයක දී ප්‍රශ්න නොකරනු ලැබිය යුතු ය.

(6) නිලබලයෙන් පත්වන සාමාජිකයන් හැර කාලය ගෙවී යාම නිසා ධුරය හිස් කරන යම් සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(7) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ යම් කාලයක් තුළ ස්වකීය ධුරයේ කාර්ය කිරීමට යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන්නේ නම්, ඒ කාලය තුළ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ඒ සාමාජිකයා පත් කළ ආකාරයෙන් ම, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(8) ඒ සාමාජිකයන් සඳහා පාරිශ්‍රමික සහ ගෙවීම් කරනු ලබන ආකාරය, අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු, තීරණය කරනු ලැබිය හැකි ය.

කමිටුවේ කර්තව්‍ය.

5. (1) පළිබෝධ නාශක ලියාපදිංචි කිරීමට, පළිබෝධ නාශක බහාලන භාජන අනුමත කිරීමට හා පළිබෝධ නාශක ගබඩා කිරීමට, සකස් කිරීමට, ආනයනය කිරීමට, විකිණීමට සහ පාවිච්චියට අදාළ කවර වූ හෝ වැදගත් කරුණක් සම්බන්ධයෙන් හා මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ඊට අදාළ වෙනත් කරුණු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට උපදෙස් දීම කමිටුවේ කර්තව්‍ය විය යුතු ය.

(2) (අ) කමිටුව විසින්, පහත දක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් හෝ සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:—

(i) කමිටුවේ රැස්වීම්වල කාර්ය පටිපාටිය;

(ii) කමිටුවේ කටයුතු පවත්වාගෙන යාම; සහ

(iii) කමිටුවේ කටයුතු කරගෙන යාම හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික සියලු කරුණු.

(ආ) කමිටුවේ සියලු සාමාජිකයන් පැමිණ සිටින රැස්වීමක දී ඒ රීති සාදනු ලැබිය යුතු ය.

(ඇ) කමිටුව විසින් සාදනු ලබන කවර වූ හෝ රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන්නේ නම් මිස, බලාත්මක නොවිය යුතු ය.

බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීම.

6. (1) යම් පළිබෝධ නාශකයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙක් ම රෙජිස්ට්‍රාර්වරයා වෙත ඒ සඳහා ඉල්ලීමක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක ම පහත සඳහන් විස්තර අඩංගු විය යුතු ය:—

(අ) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය;

(ආ) ඒ ඉල්ලීම කරනු ලබන්නේ යම් පළිබෝධ නාශකයක් සම්බන්ධයෙන් ද ඒ පළිබෝධ නාශකය සාදන්නාගේ හෝ නිෂ්පාදකගේ නම සහ ලිපිනය;

(ඇ) ඒ පළිබෝධ නාශකය කවර වෙළෙඳ නාමයක් යටතේ අලෙවි කිරීමට හෝ විකිණීමට අපේක්ෂා කෙරෙන්නේ ද යන වග;

(ඈ) ඒ පළිබෝධ නාශකය විකුණනු ලබන්නේ යම් භාජනයක බහා ද ඒ භාජනයේ ඇලවිය යුතු ලේබලයේ කෙටුම්පතේ පිටපතක්;

(ඉ) ඒ පළිබෝධ නාශකය බෙදහරිනු ලබන්නේ හෝ විකුණනු ලබන්නේ යම් භාජනයක බහා ද ඒ භාජනයේ සැම්පලයක්;

(ඊ) ඒ පළිබෝධ නාශකයේ ප්‍රයෝජන, ශක්තිය, ගබඩාගත ජීවි කාලය හා ප්‍රතිඵල සම්බන්ධයෙන් එම පළිබෝධ නාශකය සාදන්නා හෝ නිෂ්පාදකයා කියා සිටින කරුණු පිළිබඳ ප්‍රකාශයක් ;

(උ) ඒ පළිබෝධ නාශකයේ සංයුතිය, එහි රසායනික අනන්‍යතාව, ශුද්ධ බර, ගබඩා කර තිබීමේ දී එහි ස්ථාවර භාවය, පාවිච්චි කිරීමේ ක්‍රම හා පාවිච්චි කළ හැකි කාලය අවසන් වන දිනය පිළිබඳ ප්‍රකාශයක් ;

(ඌ) ඒ පළිබෝධ නාශකයේ ප්‍රතිගරලය සම්බන්ධයෙන් තොරතුරු ඇතුළුව ඒ පළිබෝධ නාශකය පිළිබඳව ප්‍රමාණවත් විෂ විද්‍යාත්මක දත්ත ;

(එ) සකස් කරන ලද සංයෝගය විශ්ලේෂණය කරන ක්‍රම ;

(ඒ) ඒ පළිබෝධ නාශකයේ අවශිෂ්ටයන් නිශ්චය කිරීමේ ක්‍රම ;

(ඔ) ඒ පළිබෝධ නාශකයේ සඵලත්වය පිළිබඳව නිල වශයෙන් වූ නැතහොත් වෙනත් පර්යේෂණ ස්ථානවල වාර්තාව හෝ රසායනාගාර, නැතහොත් ජීව විද්‍යාත්මක පරීක්ෂාවන් පිළිබඳ වාර්තාව ;

(ඕ) ඒ පළිබෝධ නාශකයේ සඵලත්වය හෝ ආරක්ෂා සහිත බව සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් තොරතුරු.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක අඩංගු තොරතුරු ඉල්ලුම්කරු විසින් රහස්‍ය වශයෙන් දෙනු ලබන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තොරතුරු රහස්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එවැනි තොරතුරක් හෙළි කිරීමට යම් අධිකරණයක් විසින් නියම කරන ලදුව එසේ කිරීම අවශ්‍ය වන අවස්ථාවක, මෙම උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

ඉල්ලීම සලකා බැලීම.

7. (1) 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබුණු කල්හි, රෙජිස්ට්‍රාර්වරයා විසින් :—

(අ) පළිබෝධ නාශකය ලියාපදිංචි කර බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) පළිබෝධ නාශකය ලියාපදිංචි කර බලපත්‍රයක් නිකුත් කරන තුරු තාවකාලික අවසර පත්‍රයක්, එහි දක්වෙන කොන්දේසිවලට අනුකූලව සීමා සහිතව ඒ පළිබෝධ නාශකය අලෙවි කිරීම හා පාවිච්චි කිරීම සඳහා නිකුත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ඇ) ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය ; තව ද ඒ ප්‍රතික්ෂේප කිරීමට හේතු සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කිරීම ඒ බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ සඳහන් කාලය සඳහා පමණක් වලංගු විය යුතු අතර, එය අලුත් කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ කල්හි එය අලුත් කරනු ලැබිය හැකි වන්නේ ය. එසේ අලුත් කිරීම, ඊට අදාළ පළිබෝධ නාශකය පිළිබඳ දත්ත රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාලෝචනය කරනු ලැබීමට යටත් ව කරනු ලැබිය යුතු ය.

බලපත්‍රය නිකුත් කිරීම

8. (1) ඉල්ලීම සමග ඉදිරිපත් කරන ලද ලේබලයේ කොටුම් පතේ පිටපතෙහි පහත දැක්වෙන විස්තර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ඇත් නම් මිස, 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් බලපත්‍රයක් නිකුත් නොකරනු ලැබිය යුතු ය:—

(අ) පළිබෝධ නාශකය විකිණිය යුත්තේ කවර වෙළෙඳ නාමයක් යටතේ ද යන වග;

(ආ) පළිබෝධ නාශකයේ වෙළෙඳ නාමය සඳහා යොදන ලද අකුරුවල ප්‍රමාණයෙන් අඩකට වඩා කුඩා නොවූ ප්‍රමාණයක අකුරුවලින් සහ වෙළෙඳ නාමය සමගම ඊට පහළින් ඒ පළිබෝධ නාශකයේ සක්‍රිය රස ද්‍රව්‍යවල පොදු නාම;

(ඇ) පළිබෝධ නාශකයේ බර සියයට සියයක් සෑදී ඇති ආකාරය දැක්වෙන පරිදි, එහි අඩංගු අනෙකුත් ද්‍රව්‍යවල බරෙහි ප්‍රතිශතය ද සමග, සංයුතියේ මුළු බරෙන් ඒ ඒ සක්‍රිය රස ද්‍රව්‍යවල බරෙහි ප්‍රතිශතය හා ඒවායේ රසායනික අනන්‍යතාව ප්‍රකාශ කෙරෙන ඒ පළිබෝධ නාශකයේ සංයුතිය පිළිබඳ ප්‍රකාශයක්; තව ද එය ද්‍රවමය සංයෝගයක් වන අවස්ථාවක දී එහි අඩංගු සක්‍රිය රස ද්‍රව්‍ය පිළිබඳ විස්තර. ලීටරයක අඩංගු ග්‍රෑම් ප්‍රමාණය අනුව දැක්විය යුතු ය;

(ඈ) බලපත්‍රය දරන්නාගේ නම සහ ලිපිනය;

(ඉ) පළිබෝධ නාශකය අවසන් වරට යෙදීමෙන් පසු පළිබෝධ නාශකය එසේ යොදනු ලැබූ වගාවේ අස්වැන්න ලබා ගැනීම සඳහා ඉකුත් විය යුතු කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් වූ තොරතුරු හා උචිත යයි රෙජිස්ට්‍රාර්වරයා සලකන අවස්ථාවක, පළිබෝධ නාශකයේ ගබඩාගත ජීව කාලය ද ඇතුළුව, පළිබෝධ නාශකය පාවිච්චි කළ යුතු ආකාරය පිළිබඳව ප්‍රමාණවත් උපදෙස්;

(ඊ) ප්‍රථමාධාර සහ ප්‍රතිගරල තොරතුරු ඇතුළුව ප්‍රමාණවත් අනතුරු ඇඟවීමේ සහ හානි වැළැක්වීමේ සංකේත හා ප්‍රකාශ;

(උ) පළිබෝධ නාශකය සඳහා මේ පනත යටතේ බලපත්‍රය දී ඇති බව දැක්වෙන නිල සංකේතයක් විය යුතු "1980 පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලදී" යන ප්‍රකාශය සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ පළිබෝධ නාශකය සඳහා දෙන ලද බලපත්‍ර අංකය;

(ඌ) මේ පනත යටතේ නියෝග මගින් නියම කරනු ලබන වෙනත් යම් විස්තර.

(2) 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පළිබෝධ නාශකයක් සඳහා බලපත්‍රයක් දී තිබෙන අවස්ථාවක, මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) සිට (ඌ) තෙක් වන ඡේදවල දක්වා ඇති කරුණු කිසිවක් සම්බන්ධයෙන් කිසිදු වෙනසක් රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමතය නොමැති ව නොකරනු ලැබිය යුතු ය.

අනුමත කරන ලද පළිබෝධ නාශක.

9. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින්, 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පළිබෝධ නාශකයක් සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති අවස්ථාවක, ඒ පළිබෝධ නාශකය අනුමත කරන ලද පළිබෝධ නාශකයක් ලෙස ඔහු විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ප්‍රකාශයක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අනුමත කරන ලද භාජන හෝ ඇසුරුම්.

10. රෙජිස්ට්‍රාර්වරයා විසින් පළිබෝධ නාශකයක් අනුමත කරනු ලබන අවස්ථාවක, ඒ පළිබෝධ නාශකය ආරක්ෂා සහිතව හා ඵලදායී ලෙස ගබඩා කිරීම සහ පරිහරණය කිරීම සඳහා අවශ්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගෙන, ඒ පළිබෝධ නාශකය අඩංගු භාජනය හෝ ඇසුරුම සතුටුදායක බවට තමා සෑහීමට පත් වන්නේ නම්, ඒ පළිබෝධ නාශකය අඩංගු භාජනය හෝ ඇසුරුම ද අනුමත කරනු ලැබිය යුතු ය.

බලපත්‍ර අවලංගු කිරීම.

11. (1) යම් තැනැත්තකු මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් නැතහොත්, කරන ලද යම් නියමයක් කඩ කරන අවස්ථාවක, හෝ, මහජනයාගේ හිත පිණිස අවශ්‍ය යයි රෙජිස්ට්‍රාර්වරයා සලකන අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින්, කමිටුවේ උපදේශය මත, ඒ පළිබෝධ නාශකය සම්බන්ධයෙන් නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීම, අත්හිටුවීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද තාවකාලික අවසර පත්‍රය අ‍පසු ගැනීම, අත්හිටුවීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) පළිබෝධ නාශකයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද බලපත්‍රය, රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අවලංගු කරනු ලබන, අත්හිටවනු ලබන හෝ සුළු වශයෙන් වෙනස් කරනු ලබන හෝ තාවකාලික අවසර පත්‍රය ආපසු ගැනීම, අත්හිටුවීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම කරනු ලබන අවස්ථාවක, අවස්ථෝචිත පරිදි ඒ අවලංගු කිරීමට, අත්හිටුවීමට, සුළු වෙනස් කිරීමට හෝ ආපසු ගැනීමට හේතු ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පළිබෝධ නාශකයක් සම්බන්ධයෙන් අවලංගු කිරීමක් හෝ අත්හිටුවීමක් කරනු ලැබූ අවස්ථාවක ඒ පළිබෝධ නාශකය අනුමත කරන ලද පළිබෝධ නාශකයක් වීම අවසන් විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම අවලංගු කිරීමක් හෝ අත්හිටුවීමක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් විය යුතු ය.

12. පළිබෝධ නාශකයක ඇසුරුමේ, ලේබලයේ හෝ සංයුතියේ යම් වෙනස් කිරීමක් සඳහා ඉල්ලීමක් කරනු ලැබ ඒ අපේක්ෂිත වෙනස් කිරීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමතය ලබා ගෙන මිස පළිබෝධ නාශකයක් සම්බන්ධයෙන් නිකුත් කළ බලපත්‍රයක් දරන්නකු විසින් පළිබෝධ නාශකය ඇසුරුමේ, ලේබලයේ හෝ සංයුතියේ කිසිදු වෙනස් කිරීමක් නොකළ යුතු ය. ඇසුරුමේ හෝ සංයුතියේ වෙනසක් කිරීම.

13. (1) 7 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම නිසා හෝ 11 වන වගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම, අත්හිටුවීම නැතහොත් සුළු වශයෙන් වෙනස් කිරීම නිසා හෝ තාවකාලික අවසර පත්‍රයක් ආපසු ගැනීම, අත්හිටුවීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම නිසා හෝ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් තමා වෙත ඒ ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම, අත්හිටුවීම, ආපසු ගැනීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම පිළිබඳ තීරණය දැනුම් දීමෙන් පසු දින හැටක් ඇතුළත දී ඒ තීරණයට විරුද්ධව ලියවිල්ලකින් වූ අභියාචනයක් (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් හඳුන්වනු ලබන) කෘෂිකාර්මික සංවර්ධනය සහ පර්යේෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ දී ඒ අභියාචනය කරනු ලැබ ඇත්තේ යම් නියමයකට විරුද්ධව ද ඒ නියමය ස්ථිර කිරීම හෝ වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම ලේකම්වරයා විසින් කරනු ලැබිය හැකි ය. අභියාචන.

(2) අභියාචනයක් පිළිබඳ ව ලේකම්වරයාගේ තීරණය සියලු ම කාර්යයන් සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය. තව ද, ඒ තීරණය කවර වූ හෝ අධිකරණයක දී ප්‍රශ්න කිරීමට භාජන නොකරනු ලැබිය යුතු ය.

14. කවර වූ හෝ තැනැත්තකු විසින් යම් පළිබෝධ නාශකයක්,— තහනම් කිරීම.

(අ) ඒ පළිබෝධ නාශකය ලියාපදිංචි කරනු ලැබ ඇත්නම් හා රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඒ සඳහා වලංගු බලපත්‍රයක් හෝ තාවකාලික අවසර පත්‍රයක් ලබා ගෙන ඇත්නම් මිස; සහ

(ආ) ඒ පළිබෝධ නාශකය බහා ඇත්තේ අනුමත කරන ලද භාජනයක හෝ ඇසුරුමක නම් හා ඒ භාජනය හෝ ඇසුරුම මත ප්‍රකටව පෙනෙන පරිදි අනුමත කරන ලද ලේබලයක් අලවා ඇත්නම් මිස,

රට ඇතුළත නිෂ්පාදනය කිරීම, සංයෝග සකස් කිරීම, ඇසිරීම, බෙදා හැරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ භාරදීම නොකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද අනුමත කරන ලද යම් පර්යේෂණ සංවිධානයක් විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමතය ඇතිව පර්යේෂණ කාර්ය සඳහා යම් පළිබෝධ නාශක හෝ පළිබෝධ නාශක සංරචක හෝ නිශ්චිත ප්‍රමාණයක් ආනයනය කරනු ලබන අවස්ථාවක, මේ වගන්තියේ ඉහත කී විධිවිධාන ඊට අදාළ නොවිය යුතු ය.

බාල කළ, නරක් වූ හෝ හානියට පත් පළිබෝධ නාශක.

15. බාල කළ පළිබෝධ නාශකයක් හෝ, බලය නැතිවී යන හෝ අන්තරාදායක වන අයුරින් නරක් වූ නැතහොත් හානියට පත් වූ පළිබෝධ නාශකයක් හෝ ගබඩා කිරීමේ දී නැතහොත් පාවිච්චි කිරීමේ දී අන්තරාදායක වන අයුරින් හානියට පත් වූ හෝ පලුදු වූ භාජනවල අසුරන ලද පළිබෝධ නාශකයක්, රට ඇතුළත නිෂ්පාදනය කිරීම, ඇසිරීම, බෙදා හැරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ භාර දීම කිසිම තැනැත්තකු විසින් නො කරනු ලැබිය යුතු ය.

ආහාර ද්‍රව්‍ය ළඟින් ම තබා පළිබෝධ නාශක ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා විකිණීම.

16. ආහාර ද්‍රව්‍ය ළඟින් ම තබා හෝ ආහාර ද්‍රව්‍ය දූෂණය වන යම් ආකාරයකින් හෝ යම් පළිබෝධ නාශකයක් ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම කිසිම තැනැත්තකු විසින් නො කරනු ලැබිය යුතු ය.

අනුමතය නොමැතිව පළිබෝධ නාශක ආනයනය කිරීම තහනම් බව.

17. කමිටුවේ උපදේශය මත දෙන ලද රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමතය ඇතිව මිස, කිසිම තැනැත්තකු විසින් යම් පළිබෝධ නාශකයක් ආනයනය නො කරනු ලැබිය යුතු ය.

පළිබෝධ නාශක පිළිබඳ දැන්වීම් ප්‍රචාරය කිරීම.

18. (1) රට ඇතුළත යම් පළිබෝධ නාශකයක් ගබඩා කරන-ප්‍රවාහනය කරන, බෙදා හරින, විකුණන, විකිණීම සඳහා ඉදිරිපත් කරන හෝ භාරදෙන විට, ඊට අදාළ වන සහ ඒ සමග ඇති යම් ලිඛිත, මුද්‍රිත හෝ රූපමය දෙයක 8 වන වගන්තියේ සඳහන් විස්තර වල හරය ඇතුළත් විය යුතු ය.

(2) අසත්‍ය, නොමග යවන සුළු හෝ වංචනික වූ ද ලියාපදිංචි කිරීමේ කොන්දේසිවලට අනුකූල නොවන්නා වූ ද ආකාරයෙන් යම් පළිබෝධ නාශකයක් පිළිබඳ දැන්වීම් ප්‍රචාරය කිරීම නීති විරෝධී වන්නේ ය.

(3) යම් පළිබෝධ නාශකයක් සම්බන්ධයෙන් යම් දැන්වීමක් හෝ උපක්‍රමයක් මගින් දක්වන කරුණු, 8 වන වගන්තියෙහි සඳහන් ලේබල්වල අඩංගු විය යුතු ප්‍රකාශවලට අනුකූල විය යුතු අතර, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ නියමයන්ට පටහැණි නොවිය යුතු ය.

පළිබෝධ නාශක තොග වශයෙන් ගබඩා කිරීම.

19. (1) පළිබෝධ නාශක තොග වශයෙන් ගබඩා කිරීමේ කාර්යය සඳහා වූ විශේෂ ගබඩවක හැර වෙනත් ස්ථානයක පළිබෝධ නාශක තොග වශයෙන් ගබඩා කිරීම කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය. බඩු පැටවීම හෝ බෑම නොකරනු ලබන විට, ගබඩාව යතුරු දමා වසා තැබිය යුතු ය.

(2) ගබඩාවෙහි තබා ඇති දේවල උපද්‍රවකාරී ස්වභාව සඳහන් කෙරෙන දැන්වීමක් ගබඩාවෙහි පිටත ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

බෝගවල අස්වැන්න ලබා ගැනීම

20. ආහාර බෝගයකට පළිබෝධ නාශක යෙදීමෙන් පසු එහි අස්වැන්න ලබා ගන්නා අවස්ථාව වන විට, නියෝග මගින් නියම කර ඇති, පළිබෝධ නාශක යෙදීම හා අස්වැන්න ලබා ගැනීම අතර වූ කාල සීමාව ඉකුත් වී නොමැති නම් හෝ නියමිත ප්‍රමාණය ඉක්ම වන පළිබෝධ නාශක අවශිෂ්ට ප්‍රමාණයක ඒ ආහාර බෝගවල අඩංගු වේ නම් හෝ පළිබෝධ නාශක යොදන ලද්දා වූ ආහාර බෝග කිසිවක අස්වැන්න ලබා ගැනීම හෝ විකිණීම සඳහා ඒවා ඉදිරිපත්කිරීම හෝ කිසිම තැනැත්තකු විසින් නො කරනු ලැබිය යුතු ය.

බලයලත් නිලධරයන් හා ඔවුන්ගේ බලතල හා කර්තව්‍ය

21. (1) මේ පනතේ කාර්ය ඉටු කිරීමෙහි ලා අවශ්‍ය වන, ස්වකීය දෙපාර්තමේන්තුවේ නිලධරයන් සංඛ්‍යාවක් අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලැබිය යුතු අතර ඒ නිලධරයන් "බලයලත් නිලධරයන්" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) බලයලත් නිලධරයකු විසින් පහත දැක්වෙන කාර්ය ඉටු කරනු ලැබිය හැකි ය:—

(අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගයක් හෝ කරන ලද නියමයක් හෝ යම් තැනැත්තකු විසින් කඩකර තිබේ ද යන වග නිසැකව දැන ගැනීම ;

(ආ) පළිබෝධ නාශකවල යම් හානියට පත්වීමක්, බාලකිරීමක් හෝ නරක්වීමක් සිදුවී තිබේදැයි තීරණය කිරීමේ කාර්යය සඳහා පළිබෝධ නාශකවල සැම්පල ලබා ගැනීම ; හා

(ඇ) මේ පනත යටතේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම හා සම්බන්ධ හෝ ඒ සඳහා වූ හෝ වෙනත් සියලු ක්‍රියා නැතහොත් දේවල් කිරීම.

(3) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමෙහි දී, බලයලත් නිලධරයකු විසින් ප්‍රමාණවත් දැනුම්දීමකින් පසුව දිවා කාලයේ යුක්ති සහගත සියලු වේලාවල දී කවර වූ හෝ ස්ථානයකට ඇතුළු විය හැකි ය. එසේ ඇතුළුවීම හේතු කොට ගෙන හෝ, මේ පනත යටතේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීමෙහිලා අවශ්‍ය වන යම් දෙයක් ඒ ස්ථානයෙහි දී සද්භාවයෙන් ඒ බලයලත් නිලධරයා විසින් කිරීම හේතු කොට ගෙන ඒ බලයලත් නිලධරයා වගකීමකට යටත් නො වන්නේ ය.

සැම්පල විශ්ලේෂණය කිරීම.

22. (1) බලයලත් නිලධරයකු විසින් පළිබෝධ නාශකයක සැම්පලයක් ලබාගත් විට, එම පළිබෝධ නාශකය බලයලත් විශ්ලේෂක යකු ලවා විශ්ලේෂණය කරවා ගැනීමට තමා අදහස් කරන බව විකුණුම්කරුට හෝ ඔහුගේ අනුයෝජිතයාට වහාම දැන්විය යුතු අතර නොපමාවම ඒ සැම්පලය සමාන කොටස් තුනකට බෙදා ඒ පළිබෝධ නාශකයෙහි ස්වභාව අනුව සුදුසු වන ආකාරයට ඒ එක් එක් කොටස ලකුණු කරවා සහ මුද්‍රා තබවා ඒ එක් කොටසක් විකුණුම්කරුට හෝ ඔහුගේ අනුයෝජිතයාට ද, එක් කොටසක් බලයලත් විශ්ලේෂකයා ට ද, එක් කොටසක් රෙජිස්ට්‍රාර්වරයාට ද භාර දිය යුතු ය.

(2) විශ්ලේෂණයක ප්‍රතිඵලය සම්බන්ධයෙන් ආරාවුලක් ඇති වූ විට රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සැම්පලයෙන් තමා භාරයේ තිබෙන කොටස, තමා විසින් නම් කරනු ලබන තීරක විශ්ලේෂකයකු වෙත යැවිය යුතු ය.

(3) මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී, මේ වගන්තිය යටතේ විශ්ලේෂණය සඳහා ලබාගත් යම් සැම්පලයකට අදාළ ව බලයලත් විශ්ලේෂකයකු විසින් හෝ තීරක විශ්ලේෂකයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්, එහි සඳහන් කරුණු පිළිබඳ ව බැලු බැල්මට පෙනෙන සාක්ෂි ලෙස පිළිගත යුතු ය.

ගාස්තු.

23. (1) (අ) 6 වන වගන්තිය යටතේ පළිබෝධ නාශකයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීම පිණිස වූ සෑම ඉල්ලීමක්ම, හා

(ආ) යම් ප්‍රතික්ෂේප කිරීමකට, අවලංගු කිරීමකට, අත්හිටුවීමකට, ආපසු ගැනීමකට හෝ සුළු වශයෙන් වෙනස් කිරීමකට විරුද්ධව 13 වන වගන්තිය යටතේ ඉදිරිපත් කෙරෙන සෑම අභියාචනයක් ම

මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලබන ගාස්තුව සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1)වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු යම් ගාස්තුවකට අතිරේක ව, මේ පනත සහ මේ පනත යටතේ සාදන ලද නියෝග ඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීම අරභයා නිසි මූල්‍ය ප්‍රතිපාදන ඇති කිරීමේ පොදු කාර්යය සඳහා, පළිබෝධ නාශකයක ආනයනකරුගෙන්, නිෂ්පාදකයගෙන්, සංයෝග සකස්කරන්නාගෙන් හෝ අසුරන්නාගෙන් වූ යම් අයකිරීමක් මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

මේ පනත කඩ කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

24. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩ කරන නැතහොත් ඒ අනුව කටයුතු කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකකට නොඅඩු කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට ඒ සෑම තැනැත්තකු ම යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක්, කළමනාකාරවරයෙක්, ලේකම්වරයෙක් හෝ නිලධරයෙක්ම; නැතහොත්

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙක් ම

ඒ වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ වරද කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීම සඳහා තමා තිසි උද්‍යෝගයෙන් යුතුව ක්‍රියා කළ බව හෝ එකී යම් තැනැත්තකු ඔප්පු කරන්නේ නම්, ඒ තැනැත්තා ඒ වරදට වරදකරුවකු ලෙස නොසලකනු ලැබිය යුතු ය.

25. මේ පනත යටතේ වරදකට යම් තැනැත්තකු වරදකරු කරන අධිකරණය විසින්, මෙහි මින් ඉහත නියම කරන ලද දණ්ඩන අතුරෙන් යම් දණ්ඩනයක් නියම කරනු ලැබිය හැකි අතර, සුදුසු යයි ඒ අධිකරණය අදහස් කරන්නේ නම් ඊට අමතරව, වරද කරනු ලැබුවේ යම් භාණ්ඩ සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ සියල්ල ම හෝ ඉන් යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ හෝ තහනමට ගෙන රාජ්‍යසන්තක කරන ලෙස අණ කරනු ලැබිය හැකි ය. රාජ්‍යසන්තක කිරීම.

26. (1) නියම කළ යුතු බවට මේ පනතින් නියමිත කාරණා හෝ නියෝග සෑදීමට බලය දෙනු ලැබ ඇති කාරණා සහ විශේෂයෙන් ම පහත සඳහන් කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:— නියෝග

(i) ලේබලයේ පිහිටීම, ප්‍රමාණය හා වර්ණ යෙදීම මෙන් ම, ලේබල්වල ප්‍රකාශ කළ යුතු කිරුම් හෝ මිනුම් ක්‍රමය හෝ ක්‍රම නියම කර දැක්වීම;

(ii) අධික හෝ අසාමාන්‍ය ලෙස උපද්‍රවකාරී තත්වයක් දරන ද්‍රව්‍ය නැතහොත් ක්‍රියාවලි පිළිබඳව විශේෂ විධිවිධාන නියම කර දැක්වීම; ඒ විශේෂ විධිවිධාන මගින් විශේෂයෙන් ම පහත දැක්වෙන කරුණු සඳහා විධිවිධාන සැලැස්විය හැකි ය:—

(අ) ඇතැම් ද්‍රව්‍ය පිළිබඳ ව ක්ෂේත්‍ර අගැයුම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) මර්දනය කිරීමට අපේක්ෂා කරන හානිකර ශාක සහ සතුන් හැර, තෙවන පාර්ශවයන්, පරිසරය සහ වන සත්ව සම්පත් ආරක්ෂා කිරීමට අවශ්‍ය විය හැකි ඇතැම් ද්‍රව්‍යයන් අලෙවි කිරීම සහ බෙදා හැරීම පාලනය කිරීම.

(iii) මේ පනත යටතේ බලපත්‍ර දී ඇති පළිබෝධ නාශක අලෙවි කිරීම සහ විකිණීම නතර කළ යුතු දිනයන් නියම කිරීම සහ ඒ පළිබෝධ නාශකයන් බැහැර කිරීම ;

(iv) පළිබෝධ නාශක නිෂ්පාදනයෙහි, සංයෝග සකස් කිරීමෙහි හෝ ඇසිරීමෙහි නියුක්තව සිටින යම් පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් යොදා ගනු ලබන කාර්මික ප්‍රවීණතාව හා උපකරණ පිළිබඳ ප්‍රමිති ඇති කිරීම ;

(v) යම් නිෂ්පාදනයක් පළිබෝධ නාශක සංයෝගයක් වශයෙන් නම් කිරීම ; සහ

(vi) පළිබෝධ නාශක භාවිත කිරීමේ ක්‍රමය සහ ආකාරය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය. තව ද එසේ පළ කිරීමේ දිනයේ දී හෝ නියෝගයෙහි නිශ්චිත ව සඳහන් කරනු ලබන පසුව එළඹෙන දිනයක දී හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඒ පරිච්ඡින්න කිරීමෙන් හානියක් නො විය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේ යම් දිනයක දී ද ඒ දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය. 27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි,—

"පළිබෝධය" යන්නෙන්, බෝගවලට, ගබඩා කළ නිෂ්පාදනවලට, සකස් කළ ආහාරවලට, දැවවලට, ඇඳුම්වලට, රෙදිපිළිවලට හෝ අප්‍රාණික වස්තූන්ට හානිකර, පීඩාකාරී හෝ අයෝග්‍ය වූ නැතහොත් මහජන සෞඛ්‍යය හා ස්වස්ථතාව සම්බන්ධයෙන් සලකන කල අයහපත් වූ යම් කෘමියෙක්, මූෂිකයෙක්, පක්ෂියෙක්, මත්ස්‍යයෙක්, මෘද්වංශිකයෙක්, පණුවර්ගයක්, දිලීර වර්ගයක්, වල් පැළෑටියක්, ක්ෂුද්‍ර ජීවියෙක්, වයිරසයක් හෝ වෙනත් වර්ගයක ශාක හෝ සත්ව ජීවයක් අදහස් වන අතර, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නිශ්චිතව ම ඇතුළත් කළ හෝ බැහැර කළ යම් පළිබෝධයක් නොවන, මනුෂ්‍යයාගේ බහිස්පරපෝෂිතයන් සහ සත්වයන්ගේ අන්තඃපර පෝෂිතයන් ද ඊට ඇතුළත් වේ ;

"පළිබෝධ නාශකය" යන්නෙන්, පළිබෝධයක් මර්දනය කිරීම සඳහා යෙදීමට අදහස් කරනු ලබන හෝ යොදනු ලබන යම් ද්‍රව්‍යයක් අදහස් වන අතර, සක්‍රීය රස ද්‍රව්‍ය, සහ කාරක ද්‍රව්‍ය හා පළිබෝධ නාශක සංයෝග ද ඊට ඇතුළත් වේ ;

"පළිබෝධ නාශක සංයෝග" යන්නෙන්, පහත දැක්වෙන කාර්ය අතුරෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා, එනම් මේ පනතේ අර්ථානුකූල වූ යම් පළිබෝධයක් විනාශ කිරීම හෝ විකර්ශණය කිරීම සඳහා නැතහොත් යම් පළිබෝධයක වැඩීම වැළැක්වීම සඳහා නැතහොත් යම් පළිබෝධයක බල පෑම හීන කරවීම සඳහා සහ ශාක පාලකයක්, ඌන කාර යක් හෝ ශෝෂකයක් වශයෙන්, නැතහොත් සහකාරක ද්‍රව්‍යයක් වශයෙන් විකුණනු ලබන, සපයනු ලබන, භාවිතය සඳහා ආනයනය කරනු ලබන නැතහොත් භාවිත කරනු ලබන මිශ්‍ර කළ හෝ මිශ්‍ර නොකළ යම් නිෂ්පාදනයක් අදහස් වන අතර, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් එසේ නම් කරන ලද යම් සමාන නිෂ්පාදනයක් ද ඊට ඇතුළත් වේ;

"බලයලත් විශ්ලේෂක" යන්නෙන්, ආණ්ඩුවේ රසපරීක්ෂක වරයා, ආණ්ඩුවේ අතිරේක රසපරීක්ෂකවරයා, ආණ්ඩුවේ නියෝජ්‍ය රසපරීක්ෂකවරයකු, ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහ කාර රසපරීක්ෂක වරයකු, ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂකවරයකු සහ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයක් මගින් බලයලත් විශ්ලේෂකයකු වශයෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;

"සක්‍රිය රස ද්‍රව්‍යය" යන්නෙන්, සංයෝග කළ නිෂ්පාදනයකට පළිබෝධ නාශක ගුණාංග ගෙන දෙන යම් ද්‍රව්‍යයක් අදහස් වේ;

"සහකාරක ද්‍රව්‍යය" යන්නෙන්, පළිබෝධ නාශකයක සඵලත්ව යට ආධාරකයක් වශයෙන් යොදන යම් ද්‍රව්‍යයක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1. තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක